## විදේශ අමාත්‍යාංශය

### ශ්‍රී ලංකා විදේශ සේවයේ III වැනි ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2020 (2021)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, අංක 2/223 හා 2021.04.09 දින පළ වූ *ගැසට්* නිවේදනයේ '' I වැනි කොටස : I වැනි ඡේදය - නිවේදන '' යටතේ ශ්‍රී ලංකා විදේශ සේවයේ III වැනි ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2020 (2021) ට අදාළව පහත සඳහන් සංශෝධන සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලැබී ඇත.

*සංශෝධනයයි*

ශ්‍රී ලංකා විදේශ සේවා විභාගය සඳහා අයදුම්පත් කැඳවමින්, ඉහත පළ වූ *ගැසට්* නිවේදනයේ 08 (III) වගන්තියේ සඳහන් අයදුම්පත් කැඳවීමේ අවසන් දිනය 2021.06.04 දක්වා දීර්ඝ කර ඇති බව මෙයින් දන්වමි.

තව ද, නිවේදනයේ 04 වගන්තියේ සඳහන් උපරිම වයස් සීමාවන් මුල් *ගැසට්* නිවේදනයේ සඳහන් අයදුම්පත් කැඳවීමේ අවසන් දිනයට (2021.05.10) බලපැවැත්වෙන පරිදි නොවෙනස්ව පවතිනු ඇත.

අද්මිරාල් මහාචාර්ය ජයනාත් කොළඹගේ,
ලේකම්,
විදේශ අමාත්‍යාංශය.

විදේශ අමාත්‍යාංශය,
ජනරජ ගොඩනැගිල්ල,
කොළඹ 01,
2021 මැයි මස 21 වැනි දින.